# <u>මුදල් කොමිෂන් සභාවේ කාර්යසාධනය</u>

# <u>2017 අප්‍රේල් 01 සිට 2017 ජුනි 30 දක්වා</u>

## 01. පළාත් වාර්ෂික සංවර්ධන සැලැස්ම සඳහා එකඟතාවය ලබාදීම

නැගෙනහිර පළාත හැර අනෙකුත් පළාත්වල පළාත් සංවර්ධන සැලසුම් සඳහා ප්‍රතිපත්තිමය එකඟතාවය පළමු කාර්තුවේදීම ලබාදී ඇත. නැගෙනහිර පළාත් සංවර්ධන සැලැස්ම 2017 මාර්තු 28 වන දින ලැබුණු අතර, එය 2017 අප්‍රේල් 07 දින පළාත තුළ සාකච්ඡා කරන ලදී. සාකච්ඡාවේදී එකඟ වූ පරිදි සංශෝධනවලට යටත්ව එය ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපත්තිමය එකඟතාවය ලබාදෙන ලදී.




## 02. 2018 වසර සඳහා පුනරාවර්තන හා ප්‍රාග්ධන අවශ්‍යතා ලබාගැනීම

මුදල් කොමිෂන් සභාවට සෑම පළාතකින්ම 2018 වසර සඳහා පුනරාවර්තන අවශ්‍යතා ලැබී තිබේ. සබරගමුව, ඌව, වයඹ, මධ්‍යම හා උතුරු පළාත්වල ප්‍රාග්ධන අවශ්‍යතා මෙම කාර්තුවේදී ලැබී ඇත. අදාල පළාත් සහ නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් පළාත් අවශ්‍යතා පිළිබඳ සමාලෝචන රැස්වීම් තුන්වන කාර්තුවේදී පැවැත්වීමට නියමිතය.

## 03. සැලසුම් කිරීම හා අධීක්ෂණය සඳහා මාර්ගෝපදේශ ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව සමග ඒකාබද්ධව සකස් කිරීම

ජාතික හා උප ජාතික මට්ටම් සඳහා ඒකාබද්ධ සැලසුම්කරණ යාන්ත්‍රණයක් හඳුන්වාදීමේ අරමුණින් එක් එක් අංශ සඳහා සංකල්ප පත්‍රිකා හා සැලසුම් ආකෘති පත්‍ර සහ එක් එක් අංශය සඳහා සංරචක සහ උප සංරචක සකස් කර ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සමග සාකච්ඡා කර ඇත. ඒවා තවදුරටත් සහයෝගීව වර්ධනය කරගැනීම සඳහා අනෙකුත් අදාල ආයතන සමග සාකච්ඡා කළ යුතුය.

**04. මුදල් කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව - 2016**

මුදල් කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව - 2016 පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා ජනාධිපති ලේකම් කාර්යාලයට භාෂා තුනෙන්ම ඉදිරිපත් කළ යුතුය. වාර්තාවේ ඉංග්‍රීසි අනුවාදයේ කෙටුම්පත සම්පූර්ණ කර ඇති අතර, එම වාර්තාව සිංහලට හා දෙමළට පරිවර්තනය කර ඇත.

**05. පළාත් විගණනය පිළිබඳ වාර්තා සැකසීම**

විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් සිදුකරන ලද මධ්‍යම, දකුණු සහ සබරගමුව පළාත්වලට අයත් විගණන වාර්තා අධ්‍යයනය කරන ලද අතර, ඒවායෙහි විශේෂිත කරුණු ප්‍රධාන ලේකම්වරුන්, ආණ්ඩුකාරවරුන් සහ විගණකාධිපති වෙත යොමු කර ඇත.

**06. මුදල් කොමිෂන් සභාව සඳහා නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම**

මුදල් කොමිෂන් සභාවේ පරිපාලන ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු දැන් ක්‍රියාත්මක වෙමින් පවතී. මුදල් කොමිෂන් සභාවෙහිදී මේ සම්බන්ධයෙන් ප්‍රගති සමාලෝචන රැස්වීම් තුනක් සහ වැඩබිමේ රැස්වීම් තුනක් ව්‍යාපෘති උපදේශක අංශය (මොරටුව විශ්වවිද්‍යාලයේ වාස්තු විද්‍යා පීඨය) සහ කොන්ත්‍රාත්කරු සමග පවත්වන ලදී. ජූනි 30 වන දිනට වියදම අනුමත මුළු මුදල වන රුපියල් මිලියන 300 න් රුපියල් මිලියන 88 කි. ව්‍යාපෘතියෙහි වැඩ සැලැස්මට අනුව දින 60 ක ප්‍රමාදයකින් යුතුව ක්‍රියාත්මක වන බව නිරීක්ෂණය කර ඇත.

**07. මුදල් කොමිෂන් සභාවේ දත්ත පද්ධතිය සහ කළමනාකරණ තොරතුරු පද්ධතිය**

මුදල් කොමිෂන් සභාවේ භාවිතය සඳහා අභ්‍යන්තර කළමනාකරණ තොරතුරු පද්ධතියක් සකස් කිරීම සම්බන්ධයෙන් ආසියා පදනම සමග සාකච්ඡා මාලාවක් මුදල් කොමිෂන් සභාව විසින් පවත්වන ලදී. කොමිෂන් සභාවේ මගපෙන්වීම අනුව ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය සමග රැස්වීම් කිහිපයක් පැවැත්විණ. එසේම, ව්‍යාපෘති කළමනාකරණ සහ අධීක්ෂණ දොපාර්තමේන්තුව විසින් මුදල් කොමිෂන් සභාවේ සහ පළාත් සභාවල කළමනාකරණ තොරතුරු පද්ධතියක අවශ්‍යතාවය සපුරාලීම සඳහා දැනට පවතින කළමනාකරණ තොරතුරු පද්ධතිය වැඩිදියුණු කිරීමට පියවර ගෙන ඇත.

**08. මුදල් කොමිෂන් සභා පනත් කෙටුම්පත**

මෙම පනත සකස් කර අතිගරු ජනාධිපතිතුමාට ඉදිරිපත් කරන ලදී. ජනාධිපති ලේකම් කාර්යාලය විසින් කෙටුම්පත සම්බන්ධයෙන් යම් යම් නිරීක්ෂණ ඉදිරිපත් කර තිබේ. මුදල් කොමිෂන් සභාව විසින් එම නිරීක්ෂණ සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සඳහා ජනාධිපති ලේකම් කාර්යාලයේ නීති අංශයෙන් ඉල්ලීමක් කර ඇත.

**09. 33 වන ප්‍රධාන අමාත්‍ය සමුළුව**

අතිගරු ජනාධිපතිතුමාගේ නියමයෙන් 33 වැනි ප්‍රධාන අමාත්‍යවරුන්ගේ සම්මේලනය 2017 මැයි 06 වන දින හබරණ සිනමන් ලොජ්හි දී පැවැත්විණි. කොමිෂන් සභාවේ සභාපති හා ලේකම් ඊට සහභාගි විය.

ප්‍රාදේශීය මට්ටමේ ගැටළු සාකච්ඡා කිරීම සහ නිර්දේශ ලබාදීම සඳහා පළාත් නියෝජිතයින්ට අවස්ථාවක් ලබාදීම සම්මන්ත්‍රණයේ ප්‍රධාන අරමුණ විය.

## 10. නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය

### පුහුණු කිරීම

කොමිෂන් සභාවේ නිලධාරීන් හතර දෙනෙකු කැරබියන් සහ දකුණු පැසිපික් රටවල් සඳහා රාජ්‍ය මූල්‍ය කළමනාකරණය සහ සේද මාවතේ රටවල්වල ජනතාවගේ ජීවන තත්ත්වය දියුණු කිරීම සම්බන්ධයෙන් වන කෙටිකාලීන (සති 2-3) පුහුණු වැඩසටහනකට සහභාගි විය. වැඩසටහන චීනයේ පැවැත්විණ.

- නිශාන්ත සුජීව මහතා, සහකාර අධ්‍යක්ෂ
- එරන්දි ගුණසේකර මහත්මිය, සහකාර අධ්‍යක්ෂ
- සරත් චන්ද්‍රකුමාර මහතා, වැඩසටහන් නිලධාරි
- දිනූෂා හේරත් මහත්මිය, වැඩසටහන් නිලධාරි

### ආරාධිත දේශන

ජපාන ජාත්‍යන්තර සහයෝගිතා සංවිධානයේ (JICA) උපදේශක ෂුනිචිරෝ හොන්ඩා මහතා විසින් ජපාන ප්‍රාදේශීය පාලන ක්‍රමය, මූල්‍යකරණය පිළිබඳව අවධානය යොමු කරමින් දේශනයක් ඉදිරිපත් කරන ලදී.



## 11. මුදල් කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩල ප්‍රවර්ධනය

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2016 දෙසැම්බර් 27 දින සිට ක්‍රියාත්මක වන පරිදි එම්.එල්.ඒ.චන්ද්‍රදාස මහතා මුදල් කොමිෂන් සභාවේ දෙපාර්තමේන්තු සේවයේ උසස් කරන ලදී. ඒ අනුව, ඔහු දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ තනතුර සඳහා සුදුසුකම් ලබයි.

## 12. මුදල් කොමිෂන් සභාවේ කාර්යසාධන වාර්තා

2017 පළමුවන කාර්තුවේ කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇත.

## 13. පළමු ශ්‍රේණියේ ගණකාධිකාරිවරයෙකු බඳවා ගැනීම

මුදල් කොමිෂන් සභාවට සුදුසු පළමු ශ්‍රේණියේ නිලධාරියෙකු පත්කිරීමට 2016 වසරේදී කොමිෂන් සභාව විසින් තීරණය කරන ලදී. එම උත්සාහයේ ප්‍රතිඵලයක් වශයෙන් සුදුසු නිලධාරියෙකු හඳුනාගන්නා ලද අතර, ඔහු මුදල් කොමිෂන් සභාවට මාරු කිරීම සඳහා ඉල්ලීමක් රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය වෙත යොමුකර ඇත.

## 14. පර්යේෂණ අංශය

පර්යේෂණ ඒකකය ස්ථාපිත කර ඇත. කෙසේවෙතත්, එහි කටයුතු ආරම්භ කිරීමට අවශ්‍ය මානව සම්පත් වැඩිදියුණු කළ යුතුව ඇත.

## 15. විගණන කමිටු පිහිටුවීම සහ ක්‍රියාත්මක කිරීම

කළමනාකරණ සහ විගණන කමිටුව පිහිටුවන ලදී. විගණන අධිකාරිවරයා සහ කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ සමග ප්‍රථම රැස්වීම පැවැත්විණ. රැස්වීමේ තීරණයන් මුදල් කොමිෂන් සභාවේ සියලු කාර්ය මණ්ඩලය වෙත ඉදිරි කටුයුතු සඳහා දැනුවත් කරන ලදී.

## 16. මනා සම්බන්ධීකරණය තුළින් ජාතික හා පළාත් මට්ටමේ සංවර්ධනය වැඩිදියුණු කිරීම පිළිබඳ වැඩමුළුව

2015 ජුනි මස 15 වැනි දින පවත්වන ලද මෙම වැඩමුළුවේ තීරණ හා නිර්දේශ පසු විපරම් කිරීමට කොමිෂන් සභාව විසින් හඳුනාගත් ගැටළු හා නිර්දේශ මත පදනම් වූ පිරික්සුම් ලැයිස්තුවක් සකස් කරන ලදී. එම පිරික්සුම් ලැයිස්තුව ක්‍රියාකාරකම් සැලසුම සමග ජනාධිපති ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කරන ලදී. එහි ප්‍රතිඵලයක් වශයෙන්, වැඩමුළුවේදී ඉදිරිපත් කරන ලද නිර්දේශයන්හි ප්‍රගතිය සාකච්ඡා කිරීම සඳහා ජනාධිපති ලේකම්වරයා 2017 පෙබරවාරි 22 දින රැස්වීමක් කැඳවා තිබුණි. අදාල අමාත්‍යාංශ හා ආයතනවල ජ්‍යෙෂ්ඨ නිලධාරීන් මෙම රැස්වීමට සහභාගී විය. ජනාධිපති කාර්යාලය විසින් කරන ලද ඉල්ලීම අනුව මුදල් කොමිෂන් සභාව විසින් මේ සම්බන්ධයෙන් ප්‍රගතිය සමාලෝචනය කරනු ලබයි.

## 17. විශේෂ අධ්‍යයන

මුදල් කොමිෂන් සභාවේ ක්‍රියාකාරකම් සඳහා විශේෂ අධ්‍යයනයන් ගණනාවක් සිදු කරන ලදී. එයට ඇතුළත් වන්නේ:

- පුද්ගල පඩිනඩි සම්බන්ධ වියදම සහ පළාත විසින් බඳවාගත් කාර්ය මණ්ඩල
- පළාත් සංවර්ධනය සඳහා 2016-2017 අතර කාලයේ මූල්‍ය වෙනස
- සෞඛ්‍ය අංශයේ වියදම් පිළිබඳ අධ්‍යයනය

## 18. කොමිෂන් සභා රැස්වීම්

පහත සඳහන් කොමිෂන් සභා රැස්වීම් පැවැත්විණ.

- 2017 අප්‍රේල් 04
- 2017 මැයි 17
- 2017 මැයි 20 (විශේෂ රැස්වීම)
- 2017 ජුනි 03